# 2018 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීම 2018.10.04 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.09.13 වන දින පැවති මාසික සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

I. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා පළාත් පාලන ආයතන වල සහභාගීත්වය.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.08.10 දිනැතිව නිකුත් කරන ලද ස්වදේශ කටයුතු චක්‍රලේඛ 4/2018 අනුව ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින්ට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වීමේදී එකී චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කලයුතු බව දන්වා ඇති බව ගරු සභාපතිතුමා සභාවට නිවේදනය කරන ලදී.

II. පළාත් පාලන ආයතනයන්හි කාන්තා සභිකයින් දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය පුහුණු වැඩසටහන.

පළාත් පාලන ආයතනයන්හි කාන්තා සභිකයින් දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහනක් 2018.10.16 දින පුස්සැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

III. පළාත් පාලන ආයතන සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම.

ප්‍රධාන ලේකම්තුමා විසින් 2018.09.26 දිනැතිව එවන ලද විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය මඟින් වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රමුඛ ව්‍යාපෘතියක් වන "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහන යටතේ සූර්ය බලයෙන් සිදු කරන විදුලිය නිපදවීමේ ව්‍යාපෘතියට සම්බන්ධවීමෙන් පළාත් පාලන ආයතනයන්ට ආදායම් උත්පාදනය කරගත හැකි බවත්,ඒ සම්බන්ධව අත් පොතක් එවා ඇති බවත්,ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

ලිපි,පෙත්සම් හා පැමිණිලි කිසිවක් ඉදිරිපත් නොවිණි.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. කල් දී ඇති යෝජනා

5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. ප්‍රාදේශීය සභා පනතේ 216 මඟින් ලබා දී ඇති අධිකාරිය මත සභාවේ කාර්ය හා කර්තව්‍ය පහසු කිරීම පිණිස සභාවේ සේවකයින්ගේ දෛනික වැටුප්,ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප්,මන්ත්‍රී දීමනා සහ රු .5001/= සිට රු . 50000/= ක් දක්වා වූ පුනරාවර්තන / ප්‍රාග්ධන වියදම් ,මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් දැරීමේ අධිකාරිය තමා වෙත ලබා දීම සුදුසු බව යෝජනා කරන ලදී.

II. හුණුවල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට පැමිණෙන රෝගීන්ගේ සහ කාර්යය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා වැසිකිලියක් ඉදිරිකිරිමට අවශ්‍ය බවත්,

III. උපදේශක කාරක සභාවක් පත් කර ගැනීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා ඉදිරිපත් කල පළමු යෝජනාව එනම් රු.50000/= ට අඩු වියදම් දැරීමේ අධිකාරිය සභාපතිතුමා වෙත ලබා දීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා විරුද්ධත්වය ප්‍රකාශ කර සිටි අතර ,ඒ පිළිබඳව පැවති විවාදයෙන් අනතුරුව වැඩිදෙනාගේ එකඟතාව මත එම යෝජනාව සහ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල II,III යෝජනා එකමතිකව සභා සම්මත විය.

IV. ගරු සභාපතිතුමා විසින් සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා සේවයේ යොදා ගැනීමට පහත නම් සඳහන් අයට වසරක වැටුප් ගෙවීමට 2019 අයවැය ලේඛනයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර තැබීමට අනුමැතිය ඉල්ලා සිටින ලදී.

- ඩී.කේ.සමන් අමරසිංහ මයා.
- පී.වසන්ත ප්‍රියලාල් මයා.
  ඉහත එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

V. කාර්යාලය ඉදිරිපිටට එළීම සඳහා රබර් පාපිස්සක් ගැනීම අවශ්‍ය බවත්,
VI. ලේඛනාගාරයට Magazine Holder 50ක් හා විදුලි පංකාවක් සවිකර ගැනීම අවශ්‍ය බවත්,
VII. සභාව සතු කුඩාරම් 10 අළුත්වැඩියා කිරීම සහ පුටු 50 ක් මිලදී ගැනීම අවශ්‍ය බවත්,
VIII. 252/6373 කැබ් රථය අළුත්වැඩියා කිරීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමාගේ අංක V සිට VIII දක්වා වූ යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

IX. සභාවේ පවතින දැක්ම මෙහෙවර ඉදිරියට පවත්වාගෙන යාමට හෝ සංශෝධනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ විවිධ අදහස් පල වූ අතර,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා ඒ පිළිබඳව විවරණයක් කරමින් 'දැක්ම' සහ 'මෙහෙවර' කාලෝචිතව වෙනස් විය යුතු බව අදහස් දක්වීමෙන් අනතුරුව එය සංශෝධනය කිරීමේ යෝජනාවට සභාවේ ඒකමතික එකඟතාව පළවිය.

X. ගරු සභාපතිතුමා විසින් පුරප්පාඩුව පවතින පෙරපාසල් පාලිකා තනතුර සඳහා ඩබ්ලිව්.ඒ.සුරන්දි මධුෂානි වීරකෝන් මිය බඳවා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් වැඩිදුරටත් කරුණු දක්වමින් මුත්තෙට්ටුපොල සුමඟ පෙර පාසලේ සිටින පෙරපාසල් ගුරු තනතුරේ ස්ථිර සේවයේ නියුතු එම්.ඒ.දයාවතී මැණිකේ මහත්මිය 2018.11.15 දින විශ්‍රාම යාමට නියමිත බැවින්, එම තනතුර සඳහා සුදුසුකම් සහිත අයෙක් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රකාශ කරන ලදී.ඒ අනුව පෙරපාසල් පාළිකා තනතුර සඳහා සුදුසුකම් ඇති අයෙකු සොයා ගැනීමට වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මුල් ළමාවිය සංවර්ධන නිලධාරිනියන් සමඟ සාකච්ඡා කර ඉහත නම් සඳහන් මහත්මිය හදුනාගත් බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.මෙම කරුණ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විරෝධය පල කරමින් දැනට සිටින සහය පාලිකාවම එම තනතුර ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේය.,ඒ සම්බන්ධව අදහස් පල කල ගරු සභාපතිතුමා පෙර පාසල් පාළිකා සේවා ව්‍යවස්ථාවට අනුව දැනට සිටින සහය පාලිකාව අදාල සුදුසුකම් සපුරා නොමැති බැවින්,එම තනතුරට ඇයව පත්කල නොහැකි බව සඳහන් කළේය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා ,පෙරපාසල් විෂය සඳහා බඳවා ගැනීමක් සභාව මඟින් සිදු කිරීමේ හැකියාවක් පවතීද යන්න විමසා සිටින ලදී.එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා,පෙර පාසල් විෂය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින්ද අධීක්ෂණය වන අතර ප්‍රාදේශීය සභාව සතුව පවතින සඳගනාගම,ඕපනායක හා මුත්තෙට්ටුපොල පෙරපාසල් තුනෙහි වගකීම සභාව සතුවන බැවින්,ඒ අනුව ඉදිරියේදී පුරප්පාඩු වන මුත්තෙට්ටුපොල සුමඟ පෙරපාසල් පාළිකා තනතුර සඳහා බඳවා ගැනීම් පළාත් සභාව හරහා සිදු කර දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කරන ලද යෝජනාව වැඩි දෙනාගේ කැමැත්ත මත සභා සම්මත විය.

XI. 2018/2019 පුහුණු සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙසත්,

XII. 2018.10.01 දින සිට 2022.10.01 දක්වා වසර 4 තුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පැළ 10000ක් සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත්,

XIII. පනාකාරගොඩ මාර්ගය හෙවත් අකරුල්ල වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල මාර්ගය සංවර්ධනය කිරීමට අදාල රු.215000/=ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්,යෝජනා කරන ලදී.

ඉහත ගරු සභාපතිතුමාගේ XI,XII හා XIII යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පැළ රෝපනය කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ප්‍රදේශයේ විහාරස්ථාන මුල් කර ගෙන ඔසු පැළ සිටුවීමටත්,පාසල් වතු ආශ්‍රිතව පළතුරු පැළ සිටුවීමට සහ වගුරුබිම් ආශ්‍රිතවත් වන සංරක්ෂණ ඉඩම් වලත් පැළ රෝපනය කිරීමට එම ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට අපේක්ෂා කරන බව ප්‍රකාශ කල ගරු සභාපතිතුමා ඒ සඳහා අවශ්‍ය පැළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබා දීමට එකඟවී ඇති අතර ප්‍රාදේශීය සභාව මඟිනුත් අවශ්‍යතාව අනුව පැළ ලබා ගැනීමට කටයුතු කරන බව පැවසීය.අනතුරුව ගරු සභාපතිතුමාගේ ඉහත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා

**XIV.** ප්‍රාදේශීය සභාවේ සේවය කරන විදුලි කාර්මික ඒ.එම්.සිරිරත්න මහතාට රක්ෂණාවරණයක් ලබා දිම අවශ්‍ය බවත්,

**XV.** 2018-2022 දක්වා කසළ කළමනාකරණ සැලැස්ම සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත්,

**XVI.** ප්‍රාදේශීය සභා පනතේ 168 ප්‍රකාරව හා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය මඟින් නියම කර ඇති ආකාරයට 2019 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු රු 1000/= ක් අයකිරීමටත්,එම දැන්වීම පුවත්පත් වල පල කිරීම සඳහාත් සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඉහත **XIV** යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා විදුලි කාර්මික මහතා ඉතා අවධානම්කාරී කාර්යයක් ඉටු කරන බැවින්, ඔහුගේ ජීවිතයට ඇති අවදානම සළකා බලා ඔහුට ජීවිත රක්ෂණයක් ලබා දීමේ දැඩි අවශ්‍යතාවක් ඇති බව ප්‍රකාශ කලේය.ඒ අනුව ගරු සභාපතිතුමාගේ **XIV,XV** හා **XVI** යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

I. පහත සඳහන් ස්ථාන සඳහා විදී ලාම්පු සවිකර ගැනිම අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

- උඩරංවල විජයනන්දාරාමය විහාරස්ථානය හන්දිය ( උඩරංවල පොදු සුසාන භූමිය අසල)
- උඩරංවල පාසල අසල
- උඩරංවල - දෙල්වලකන්ද මාර්ගයේ සිම්යොන් මුදලාලි මහතාගේ කඩය අසල හන්දිය
- උඩරංවල විජය නන්දාරාම විහාරස්ථානයේ පිවිසුම (තොරණ අසල)
- උඩරංවල ඩේවිඩ් මුදලාලි ගේ කඩය අසල හන්දිය.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම් ආර් රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උඩරංවල ග්‍රාම නිලධාරී වසමට ප්‍රාදේශීය සභාවෙන් කිසිදු සේවාවක් මේ වන තෙක් සිදු වී නොමැති බවට සිය අප්‍රසාදය පල කල ගරු මන්ත්‍රීතුමා , ඉහත යෝජනා සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. ඉහත අදහස් දැක්වීම ප්‍රතික්ෂේප කල ගරු ප්‍රාදේශීස සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා උඩරංවල - රංවල මාර්ගය සකස්කර එහි බස් රථයක් ධාවනයට යොදවා ඇතිබවත්,නැකත්වලකඩ ප්‍රදේශයට විදුලිය ලබා දීමට සභාව කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කළේය. විදුලි කාර්මික මහතා හදිසි අනතුරකට ලක්ව ඇති බැවින්,ඔහු පැමිණි විහස වීථි පහන් සවි කිරීමට කටයුතු සිදු කළ හැකි බවට ගරු සභාපතිතුමා විසින් මෙම අවස්ථාවේදී ප්‍රකාශ කිරීමෙන් අනතුරුව.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඒකමතික අනුමැතිය පල විය.

### 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නපාල මැතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභා ගත කරන ලදී.

I. බෙලිමාලියද්ද වසමේ කෙවලගල ගම්මානයේ සුසාන භූමියට ගම්මානයේ ඉතිරි කොටසට සහ වෙල්යායට යන මාර්ගය කොන්ක්‍රිට් දමා සැකසිම අවශ්‍ය බවත්,

II. බෙලිමාලියද්ද වසමේ හෙල්ලිවතුගොඩ මාර්ගය කොන්ක්‍රිට් දමා සැකසිම අවශ්‍ය බවත්,

III. බී.ආර් ජයලත් මහතාගේ නිවස අසල සිට ඩී. රත්නායක මහතාගේ නිවස දක්වා වූ පිටමුල්ල මාර්ගය කොන්ක්‍රිට් දමා සැකසිම අවශ්‍ය බවත්,

IV. හඳගිරිගොඩ ඇළ මාර්ගය පස් දමා සකස් කිරිම අවශ්‍ය බවත්,

V. උඩගංගොඩ වසමේ සුවඳනෙළුම් ගම පන්සල් පාරේ ඉතිරි කොටස කොන්ක්‍රිට් දමා සැකසිම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා විසින් ස්ථීර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. හටංගල කහකැටිආර මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
II. හටංගල දියවිනි කුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
III. යටිපස්ගමුව සුසානභූමිට පිවිසුම් මාර්ගය වෙන්කරවා දෙන ලෙසත්,
IV. පළුගහවෙල ප්‍රජා ශාලාව අළුත්වැඩියා කිරීම අවශ්‍ය බවත්,
V. උඩගංගොඩ කළුකන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
VI. නව ගම්මානය පාර කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමාගේ III වෙනි යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා එම සුසානභූමියට පිවිසීමට කොන්ක්‍රීට් කරන ලද විකල්ප මාර්ගයක් ඇතිබව අනාවරණය කළේය.එබැවින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා තම III වෙනි යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.ඒ අනුව ගරු මන්ත්‍රීතුමාගේ III යෝජනාව හැර සෙසු යෝජනා ඒකමතිතව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 6.1. 2018.09.13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 200-205 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. 2018.09.12 වන දින පැවති ප්‍රසම්පාදන වාර්තාව

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ඕපනායක ප්‍රජා මණ්ඩල පෙර පාසල සඳහා වයරින් ද්‍රව්‍ය මිලදී ගැනීම පිණිස 2018.09.12 දින ප්‍රසම්පාදන කමිටුව රැස්වන ලදී.

<u>වයරින් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ලිපි ඉදිරිපත් කරන ලද ආයතන</u>

01.සදීෂ එන්ටර්ප්‍රයිසස් -ඕපනායක
02.විජේකාන්ත හාඩ්වෙයාර්- දෙල්ගස්හන්දිය
03.ශිරෝන් හාඩ්වෙයාර්-හුණුවල
04.සරත්චන්ද්‍ර හාඩ්වෙයාර්-බලංගොඩ
ඉහත ආයතන අතුරින් මිල ගණන් එවා ඇති ආයතන හා අදාල මිල ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල ගණන් හා ආයතන | | |
|---|---|---|---|---|---|
| | | | සදීෂ එන්ටර්ප්‍රයිසස් (රු.) | විජේකාන්ත හාඩ්වෙයාර් (රු.) | ශිරෝන් හාඩ්වෙයාර් (රු.) |
| 01. | 1.044 වයර් (100m) රෝල් | $1^1/_2$ | 2664.00 | 2550.00 | 2550.00 |
| 02. | අර්ත් වයර් | 25m | 1237.50 | 1125.00 | 1125.00 |
| 03. | ටූ කෝර් වයර් | 4m | 165.00 | 200.00 | 180.00 |
| 04. | මේන් වයර් | $1^1/_2$m | 390.00 | 360.00 | 345.00 |
| 05. | $^3/_4$"කන්සියුම් බට | 15 | 1125.00 | 1050.00 | 975.00 |
| 06. | $^3/_4$" T සොකට් | 10 | 80.00 | 100.00 | 100.00 |
| 07. | 1" යකඩ ඇණ | 100g | 20.00 | 20.00 | 20.00 |
| 08 | $^3/_4$"ඉස්කුරුප්පු ඇණ | 20 | 40.00 | 100.00 | 40.00 |
| 09. | CG හෝල්ඩර් | 06 | 180.00 | 180.00 | 390.00 |
| 10. | 5 A ප්ලග් බේස් | 03 | 996.00 | 1140.00 | 1140.00 |
| 11. | 13 ප්ලග් | 01 | 465.50 | 450.00 | 390.00 |
| 12. | සන් බොක්ස් | 05 | 125.00 | 250.00 | 275.00 |
| 13. | 1 ගැන් ස්විච් | 01 | 120.00 | 130.00 | 140.00 |
| 14. | 5 ගැන් ස්විච් | 01 | 448.00 | 580.00 | 540.00 |
| 15. | $^3/_4$"පැක්සිබල් හෝස් | 3m | 210.00 | 240.00 | 345.00 |
| 16. | සිවිලින් රෝස් | 06 | 270.00 | 180.00 | 330.00 |
| 17. | 30 A මේන් ස්විච්(Isolater) | 01 | 688.00 | 900.00 | 700.00 |
| 18. | ට්‍රිප් ස්විච් | 01 | 2560.00 | 3400.00 | 2700.00 |
| 19. | 16 A බේකර් කෑලි | 01 | 316.00 | 450.00 | 290.00 |
| 20. | 6 A බේකර් කෑලි | 02 | 632.00 | 900.00 | 580.00 |
| 21. | බස් බාර් | 04 | 80.00 | 80.00 | 40.00 |
| 22. | L අයරින් | 01 | 490.00 | 650.00 | 650.00 |
| 23. | L අයරින් සඳහා ඇණ | 02 | 70.00 | 120.00 | 60.00 |
| 24. | ABC(700 බොක්ස්) | 01 | 530.00 | 550.00 | 450.00 |
| 25. | $^3/_4$" ක්ලිප් | 60 | 210.00 | 300.00 | 180.00 |
| 26. | අර්ත් රොඩ් | අඩි 05 | 490.00 | 375.00 | 650.00 |
| | මුළු මුදල | | **14602.00** | **16380.00** | **15185.00** |

ඉහත මිල ගණන් අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සදීෂ එන්ටර්ප්‍රයිසස් වෙතින් රු.14602.00 ක මුදලට වයරින් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2018.09.12 දින පහත ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2018.අගෝස්තු මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 574,218.05 | වැටුප් හා දීමනා | 2,501,842.29 |
| කුලී | 339,777.59 | ගමන් වියදම් | 24,834.00 |
| බලපත්‍ර ගාස්තු | 13,000.00 | සැපයුම් හා උපකරණ | 346,360.00 |
| සේවා සඳහා ගාස්තු | 125,342.88 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියා හා නඩත්තුව | 277,783.80 |
| වරෙන්තු ගාස්තු | 23,891.87 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 223,722.67 |
| වෙනත් ආදායම් | 31,935.09 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,178,892.74 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,287,058.22 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 17,873.92 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,392,416.68 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 156,046.06 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,287,058.22 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 114,277.78 | සේවක ණය | 200,000.00 |
| තැන්පත් | 675,394.06 | තැන්පත් | 128,800.00 |
| අත්තිකාරම් | 10,998.77 | ණයහිමි | 13,168.04 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 25,000.00 |
| වෙනත් ලැබීම් එකතුව | 800,670.61 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | 100,003.50 |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | |
| | | වෙනත් ගෙවීම් එකතුව | 466,971.54 |
| මුළු එකතුව | 4,087,728.83 | මුළු ගෙවීම් | 4,015,434.28 |

## 7.2. 2018 අගෝස්තු 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.08.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **232324** | **5%** | **632622** | **33%** | **1307378** | 4470957 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 125000 | | | **123575** | **99%** | **1425** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **253800** | **100%** | **1200** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **811500** | **111%** | **(81500)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **9000** | **30%** | **21000** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **119998** | **26%** | **338002** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1407592 | **75%** | **2965547** | **49%** | **3109453** | 461349 |
| 9 | විකුණුම් | | 497000 | | | **124523** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **242750** | **23%** | **807250** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **64512** | **26%** | **185488** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **150500** | **35%** | **277500** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **59985** | **55%** | **50015** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 20880 | **81%** | **160680** | **63%** | **93320** | 5,000.00 |
| 18 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **408000** | **102%** | **(8000)** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 19 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | 87300 | 29% | 212700 | |
| 20 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | 0 | 0% | 2,000 | |
| 21 | වෘත්තීය බලපත්‍ර 1.33 | | 100 | | | - | 0% | 100 | |
| 22 | පොලී ආයෝජන 1.61 | | 500 | | | | 0% | 500 | |
| 23 | සේවක ණය පොලී1.64 | | 40000 | | | 32353 | 81% | 7647 | |
| 24 | අයකර ගතහැකි ගාස්තු2.43 | | 25000 | | | 3150 | 13% | 21850 | |
| 25 | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | 1000 | | | 1,500.00 | 150% | (500) | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 27 | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | 500 | | | - | - | 500 | |
| 28 | අය කර ගත හැකි ගාස්තු 4.43 | | 1000000 | | | 671522 | 67% | 328478 | |
| 29 | විශේෂ සැපයුම් සදහා ගාස්තු4.16 | | 5000 | | | - | - | 5000 | |
| 30 | පොළ භූමිය කුලියට දීම5.25 | | 1000 | | | 300.00 | 0.30 | 700 | |
| 31 | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | 2000 | | | 0 | 0% | 2000 | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **414042** | **47%** | **464098** | |
| | **මුළු එකතුව** | **6837036** | **15179140** | **1793042** | **26%** | **7342901** | **48%** | **7463762** | **5069874** |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරීමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 34,000 | 32% | 73000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 41000 | 21% | 159000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 7170 | 48% | 7830 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 3671 | 18% | 16,329 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 278893 | 62% | 169497 | - |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 49300 | 56% | 38,300.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 414042 | 47% | 464098 | - |

## 8. <u>පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම</u>

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බව ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

2007 වසරේ සිට බළන්ගොඩ නගරයේ පැරණි අධිකරණ ගොඩනැගිල්ලේ පිහිටි කම්කරු විනිශ්චය සභාව එම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම හේතුවෙන් මේ වන විට රත්නපුර නගරයේ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් කරුණු අනාවරණය කල ගරු මන්ත්‍රීතුමා ඒ හේතුවෙන් බළන්ගොඩ ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවට ලක්වන බැවින් ,ඒ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමිය හා අධිකරණ අමාත්‍යංශ ලේකම් දැණුවත් කර නැවත කම්කරු විනිශ්වය සභාව බළන්ගොඩට රැගෙන ඒමට කටයුතු සිදු කරණ ලෙස ඉල්ලා සිටියේය.

එසේම හුණුවල ප්‍රාදේශීය වතු රෝහලට ප්‍රතිකාර සඳහා රෝගීන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්,එහි ඇති අඩු පහසුකම් හේතුවෙන් රෝගීන් වෙනුවෙන් ප්‍රමාණවත් නොවන බවත්,පවතින ගිලන්රථය වසර 40 ක් පමණ පැරණි එකක් බවටත්,කරුණු අනාවරණය කළේය.එම රෝහලේ අඩුපාඩු සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත දන්වා යවන ලෙස සඳහන් කළේය.තවද ,ප්‍රදේශයේ ඇති ජල උල්පත් හා වගුරු බිම් සිදී යාමේ අවධානම සම්බන්ධයෙන් කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා කැළෑ එළිපෙහෙළි කර කුරුඳු,තේ වැනි බෝග වගාව මෙයට ප්‍රධාන හේතුව වන බව පෙන්වා දෙමින්, ඉදිරියේදී විශාල ගැටළුවකට මුහුණ දීමට ඉඩ ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත්,ඔිපනායක සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ යෝජනාවක් ලෙස මෙය ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලා සිටියේය.

රජය මිල සූත්‍රය යොදා ගනිමින් තෙල් මිල දිනෙන් දින ඉහල දැමීමට එරෙහිව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එයට විරෝධය පල කිරිමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර,පනාන හා මැදගංඔය විහාරස්ථාන වල විහාරාධිපති ස්වාමීන් වහන්සේලාගේ අභාවය වෙනුවෙන් ගරු සභාපතිතුමා හා කාර්යයමණ්ඩලය දැක්වූ සහය වෙනුවෙන් ද සිය ස්තූතිය පල කළේය.

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් 2018.05.03 වන දින පැවති සභා වාරයේදි රංවල රෝහලේ දන්ත ශෛල්‍යාගාරය වැසී ඇති බවත්,එහි ඇති ඉතා වටිනා උපකරණ අනාරක්ෂිත බවටත්,කළ කරණු අනාවරණය අනුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක,හා ගරු ආණ්ඩුකාරතුමිය දැණුවත් කර තිබුණද මේ වන තෙක් ඒ සම්බන්ධව පියවරක් නොගෙන ඇති බැවින් ,නැවත සිහිකැඳවීමක් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

## 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා

ගොඩකවෙල - රංවල මාර්ගය කාපට් කර සකසා ඇති බැවින් එහි ධාවනය සඳහා පාසල් බස් රථයක් ගොඩකවෙල ඩිපෝවෙන් ලබාගැනීමට කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.තවද බහුලව පවතින මත්ද්‍රව්‍ය හා මත්පැන් ජාවාරම ගැන කරුණු අණාවරණය කල ගරු මන්ත්‍රීතුමා මේ හේතුවෙන් පාසල් යන ළමුන්ද විශාල වශයෙන් විවිධ මත්ද්‍රව්‍යාන්ට ඇබ්බැහි වී ඇති බවත්,මෙම ජාවාරම් මැඩලීමට ගොඩකවෙල,වැලිගෙපොල හා ඕපනායක පොලිස් ස්ථානාධිපතිවරුන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පතිතුමා දැණුවත් කරන ලෙස ඉල්ලා සිටියේය.

එසේම තලගස්කන්ද නිවාස ව්‍යාපෘතියක් සඳහා මුල්ගල් තැබීම පිළිබඳව අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා ,නිවසක් නොමැති අයට නිවසක් ලබා දීම ඉතා අගනා කටයුත්තක් වුවත්,ඒ සඳහා යොදාගෙන ඇති බිම් කොටස එම ව්‍යාපෘතියට ලබා ගැනීම සම්බන්ධයෙන් ජනතා විරෝධයක් පවතින බැවින් වෙනත් ස්ථානයක එම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරනමෙන් දන්වා යවන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් වැලි ජාවාරම හා මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ තමා මුලින්ම විරෝධය එල කර සිටියත් එම ජාවාරම් මැඩ පැවැත්වීම සඳහා කිසිදු වගකිවයුතු ආයතනයක් මේ වනතෙක් ඒ සම්බන්ධව කිසිදු පියවරක් නොගැනීම පිළිබඳ සිය අප්‍රසාදය ප්‍රකාශ කළේය.එමෙන්ම පසුගිය ආණ්ඩු සමයේ මුල් ගල් තියා වැඩ නතරවී ඇති හඳගිරිය රණවිරු ගම්මානයේ වැඩ ආරම්භ කිරීමට මුල්ගල් තැබූ බවත්,පක්ෂ භේදයකින් තොරව නිවාස නොමැති ජනතාවට නිවාස ලබා දීම එහි අපේක්ෂාව බව ගරු මන්ත්‍රීතුමා පෙන්වා දෙන ලදී.වත්මන් රජය මේ වන විට මාර්ග සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් ,අබලන් වී ඇති මාර්ග සඳහා සභාවේ JCB යන්ත්‍රය දින දෙක තුනකට හෝ ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී

දේශපාලන පක්ෂ හා බල තණ්හාව අමතක කර සභාවේ ආදායම් තත්වය වැඩි කිරීමටත්,ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීමටත් සියළුදෙනා එක්ව වැඩ කලයුතු බව ගරු මන්ත්‍රීතුමා මෙහිදී වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.පී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් ර/උඩවෙල විද්‍යාලයේ පවතින නැටුම් ගුරුවරයෙකු නොමැති වීම හේතුවෙන් දරුවන්ගේ දක්ෂතා ඔප්නැංවීමට එය විශාල ගැටළුවක් බැවින් ,2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි එම විද්‍යාලයට නැටුම් ගුරුවරයෙකු ලබා දීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක දැණුවත් කර එම කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලීමක් කළේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පනාන විහාරස්ථානයේ ගරු ස්වාමීන් වහන්සේගේ ආදාහන පූජෝත්සවයට දැක්වූ සහයෝගය වෙනුවෙන් ගරු සභාපතිතුමාට සිය ස්තූතිය පල කරන ලදී.

අවුරුදු තුනක පමණ කාලයක් පනාන පාරේ බස් රථ ධාවනය නැවතී තිබූ අතර සභාවේ JCB යන්ත්‍රය යොදා මාර්ගය පිළිසකර කිරීම හේතුවෙන් මේ වන විට එක් බස් රථයක් ධාවනය වන බවත්,නමුත් බන්දුකන්ද බෝක්කුව ගාවින් ගමන් කිරීම අපහසු බවත් පෙන්වා දුන් අතර ගරු මන්ත්‍රීතුමා එම මාර්ගයේ සංවර්ධන කටයුතු මග නතර කිරීම පිළිබඳ අදහස් දක්වමින්,ඒ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවේදී හෝ සාකච්ඡා කර විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා

සභාව ආරම්භයේ සිටම තලගස්කන්ද ක්‍රීඩා පිටිය පිළිබඳ යෝජනාව තමන් විසින් යොමු කල බවත්,මේ වන විට එහි කොටසක නිවාස ව්‍යාපෘතියක් සඳහා මුල්ගල් තැබීමක් සිදුකර ඇති අතර ඒ සම්බන්ධව ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිය විරෝධය හා කණගාටුව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.වැඩි දුරටත් අදහස් දැක්වමින් නිවාස ව්‍යාපෘතියකට වඩා එම බිම් කොටස කර්මාන්තයක් සඳහා සුදුසු බව පෙන්වා දෙන ලදී.මැදගංඔය ප්‍රදේශයේ සිදුවන වැලි ජාවාරම විශාල ප්‍රශ්නයක් බවට පත්වී ඇති අතර ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ඒ සම්බන්ධව විමසීමේදී ,වැලි දිනකට වැලි කියුබ් 25ක් සඳහා අවසර දී ඇතිබව දන්වා සිටියත් ඒ පිළිබඳ වසමේ ග්‍රාම නිලධාරීතුමාවත් දැනුවත් නොමැති බව සඳහන් කරන ලද බැවින්,ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් විමිසීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

තවද ,ගරු මන්ත්‍රීතුමා විසින් අම්බැවිල කසළ ප්‍රශ්නය විසඳීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හා එක්ව සුදුසු වැඩ පිළිවෙලක් සලසන ලෙසත් ,මාරංතොට සිදු කරගෙන යන කසිප්පු ජාවාරම මැඩලීම සඳහා වැලිගෙපොල පොලිස් ස්ථානාධිපතිතුමා දැණුවත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

මහජනතාව නියෝජනය කරමින් ප්‍රාදේශීය සභාවට තේරීපත්වූ සභිකයින් හට ඔවුන් වෙනුවෙන් හඬ නැගීමේ අයිතිය ඇති බවත්,ඒ සඳහා කිසිවෙකුට තහංචි පැණවිය නොහැකි බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා සීමා පැනවීම පිළිබඳ සිය විරෝධය දක්වන ලදී.එමෙන්ම I ROAD ව්‍යාපෘතිය මග නතරකිරීම සම්බන්ධව වගකිවයුතු සියළු පාර්ෂව දැණුවත් කලද,ඒ පිළිබද මේ වන තෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රීතුමා ඕපනායක ප්‍රදේශයට අවුරුදු 45 කට පසු සමූපකාර ඡන්දයෙන් සභාපති ධූරය හිමි වූ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණාසේන ගුරුගේ මැතිතුමාට සිය සුබපැතුම් එක් කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පැවසීය.

“ළඟම පාසල හොඳම පාසල” වැඩසටහන යටතේ හුණුවල ධර්මරාජ විද්‍යාලයේ තිබූ පන්ති කාමරය කඩා නව පන්ති කාමරයක් ඉදිකිරීම ආරම්භ කර ඇති නමුත් මේවන විට එහි වැඩ අතරමග නැවතී ඇති බවට කරුණු අණාවරණය කල අතර,ඒ පිළිබඳ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට ලිපියක් යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා ඉල්ලා සිටින ලදී.

තවද ,ගරු මන්ත්‍රීතුමා විසින් හුණුවල වතු රෝහලේ ඉතා වටිනා දැව තොගයක් දිරාපත් වීමට ඉඩ හැර ඇති බැවින් ඒ සම්බන්ධවද සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත දන්වන ලෙසත්,කඳුකරයේ පවතින ජල උල්පත් සිදීයාමට බොහෝසේ හේතුවන ඇකේෂියා වගාව ඉවත්කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලෙසත් ඉල්ලා සිටියේය.

### සභා රැස්වීමේ නිමාව

සියළු දෙනාගේ අදහස් ප්‍රකාශ කිරීම් අනුව අද රටේ පවතින තත්වය පාසල්,රෝහල් හා මං මාවත් යන සියළු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් යම් කිසි ව්‍යාකූල තත්වයක් පෙනීයන බවත්,එසේ වන්නේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතා හේතුවෙන් හෝ ඒ සම්බන්ධව කිසිවෙක් හඬ නොනගන නිසාද විය හැකි බවත්, අවසානයේ ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් යම් සේවාවක් ඉටු කිරීමට සියළුදෙනා සහයෝගයෙන් එක්ව කටයුතු කලයුතු බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පලකල ගරු සභාපතිතුමා සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ කටයුතු පස්වරු 12.30ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව